Good Food, Good Life

Nestlé Lanka PLC News Release

Colombo: 31 October 2016

# නෙස්ලේ ලංකා සමාගම උරුම්පිරෙයි හි නවතම කිරි ශීතකිරීමේ මධ්‍යස්ථානයක් විවෘත කරයි

ශ්‍රී ලංකාව කිරෙන් ස්වයංපෝෂිත කිරීමේ අරමුණ මුල් කරගෙන, දේශීය කිරි සම්පත සංවර්ධනය කරනු පිණිස යාපනය දිසාපති නාගලිංගම් වේතනායහන් මහතාගේ ප්‍රමුඛත්වයෙන් නෙස්ලේ ලංකා සමාගම යාපනයේ තව නව කිරි ශීතකිරීමේ මධ්‍යස්ථානයක් විවෘත කරයි.

උරුම්පිරෙයි හි විවෘත වූ මේ නව කිරි ශීතකිරීමේ මධ්‍යස්ථානය කිරි ගොවීන් හට තමා විසින් නිෂ්පාදනය කරන කිරි වල ගුණාත්මක බව හා නැවුම්බව ආරක්ෂාකර ගැනීමට මෙන්ම පවුල්වල කිරි අවශ්‍යතාවය සපුරාගැනීමෙන් අනතුරුව ඉතිරිවන වැඩි කිරි ප්‍රමාණය අලෙවි කරගැනීමට පහසුකම් ලබා දේ. මෙම නව පහසුකම සමග උසස් මට්ටමේ කිරි පරීක්ෂා කිරීමේ උපකරණවල දත්ත වලට අනුව ගොවීන් සපයන කිරිවල ගුණාත්මකභාවයට මිලක් ලැබෙනු ඇත. මේ නිසා උසස්ම ප්‍රමිතියෙන් යුතු කිරි සැපයීමට ඔවුන් යොමු වේ.

නෙස්ලේ ලංකා සමාගම ශ්‍රී ලංකාවේ පෞද්ගලික ව්‍යාපාර ක්ෂේත්‍රයේ දැවැන්තම නැවුම්කිරි මිලදී ගන්නා සමාගම වන අතර, නෙස්ප්‍රේ, මයිලෝ සහ මිල්ක්මේඩ් වැනි නිෂ්පාදන සඳහා 20,000ක් පමණ දේශීය කිරි ගොවීන් ප්‍රමාණයකගෙන් නැවුම් කිරි ලබාගනියි.

දේශීය කිරි නිෂ්පාදනය වැඩි කිරීම සහ රට නැවුම් කිරිවලින් ස්වයංපෝෂණය කිරීම සඳහා 1980 දශකයේ සිට වසර ගණනක් මුළුල්ලේ නෙස්ලේ සමාගම දේශීය ගොවීන් හා රජය සමග එක්ව කටයුතු කර ඇත.

නෙස්ලේ සමාගමේ, කළමනාකාර අධ්‍යක්ෂ ෂිවානි හෙඩ්ගේ මහත්මිය මෙසේ අදහස් දැක්වූවාය.

''වසර ගණනක් තිස්සේ, උතුරු පළාත සංවර්ධනයට සහාය වන පරිදි එම ප්‍රදේශයෙන් ලබාගත හැකි උපරිම නැවුම් කිරි ප්‍රමාණය ලබා ගැනීමට අවශ්‍ය වේගවත් සහ අධිෂ්ඨානශීලී උත්සාහයන් රැසක් අප ගෙන තිබෙනවා. අප සැමවිටම දේශීය කිරි පමණක්ම ලබා ගන්නා අතර උසස් ප්‍රමිතියෙන් යුතු කිරි ආශ්‍රිත නිෂ්පාදන දේශීය පාරිභෝගිකයන් හට ලබා දෙමින්, ඔවුන්ගේ ජීවන ගුණාත්මකභාවය ඉහළ නංවමින් එය සෞඛ්‍යමත් අනාගතයක් කරා මෙහෙයවීමට කටයුතු කරනවා. උරුම්පිරෙයි හි මෙම නවතම කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානය විවෘත කිරීමෙන් අප බලාපොරොත්තු වන්නේ උතුරෙහි වෙසෙන අප ගොවීන්ගේ කිරිවල සැපයීම හා ගුණාත්මක බව ඉහල නැංවීම පමණක් නොව ඔවුන්ට ස්ථිරසාර ජීවනෝපායක්ද සැපයීමයි.''

ගවයින්ගේ පෝෂණය සහ අභිජනනය, සත්ව සෞඛ්‍යය සහ ගොවිපොළ කළමණාකරණය සහ තත්ත්ව සහතික වැනි පුළුල් පරාසයක පැතිරුණු තාක්ෂණ මාතෘකා සහ විශිෂ්ඨ භාවිතාවන් සම්බන්ධයෙන් ගොවීන් දැනුවත් කිරීමටද නෙස්ලේ සමාගම විසින් පුහුණු හා සංවර්ධන වැඩ සටහන් පවත්වනු ලබනවා. ඊට අමතරව වැඩි ඵලදායීතාවක් සහිත දෙනුත් බෝකර ගැනීම සඳහා කෘතිම සිංචනය පිළිබඳ දැනුම ලබා දීම, වැදගත් උපකරණ සහ ඖෂධ ලබාදීම සහ ගොවිපොල සංවර්ධනය සඳහා මූල්‍ය උපදේශනය ලබා දීමද සමාගම සිදු කරයි.

මෙහිදී අදහස් දැක්වූ නාගලිංගම් වේදනයාහන් මහතා මෙසේ පැවසීය.

''ගොවීන්ගේ ජීවනෝපායට අතිශය හිතකරවන අන්දමින් උතුරු පළාතේ කිරි නිෂ්පාදන ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා සිදු කළ මෙම ප්‍රශංසනීය දායකත්වය වෙනුවෙන් මම නෙස්ලේ සමාගමට මගේ ප්‍රණාමය පුදකර සිටිනවා. පුහුණුව සහ සංවර්ධනය මෙන්ම අවශ්‍ය තාක්ෂණික උපදේශනය ද ලබා දෙමින් ඔවුන් අපගේ ගොවින් සමග සංවර්ධනය උදෙසා කැපවෙමින් සිටිනවා. නෙස්ලේ සමාගම, රජයේ අපේක්ෂාව වන කිරෙන් ස්වයංපෝෂිත රටක් වෙනුවෙන් දැඩි ලෙස දායක වනවා. දේශය නැවුම්බවින්

පුරවාලීම සඳහා උරුම්පිරෙයි හි ඔවුන් ආරම්භකළ නවතම කිරි ශීතකිරීමේ මධ්‍යස්ථානය උපරිම ඵලදායී මට්ටමට ළඟාවේවා යි මම සුභ පතනවා.’’